**ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------**

### 1.1 තත්වාගණනය කළ මතය

**----------------------------**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධි විධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අප්‍රේල් 28 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2021 අප්‍රේල් 28 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම

**--------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තිය සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබද නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තුමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සපලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබද කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබද විගණකගේ වගකීම**

**------------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් , ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි.මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනිමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හදුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මගහැරීම,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබදව මතයක් ප්‍රකාශ කීරීමේ අදහසින් නොවූවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සඹහ අභ්‍යන්තර පාලනය පිළිබද අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළ දී හදුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබදව ගණන් දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව එකතු කළ අගය මත බදු මුදල රු.393,097,856 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එය රු.386,494,948 ක් වූයෙන් එකතු කළ අගය මත බදු රු.6,602,908 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි සඳහන් වෙනස් ලැබීම් යටතේ දැක්වෙන රු.393,097,856 මුදල තුල එකතු කළ අගය මත බදු මුදල මෙන්ම පසුගිය වර්ෂයට අදාල අග්‍රිම පියවීමේ මුදලද ඇතුලත් වේ | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වීම |

### 1.6.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

-------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු.6,947,387 ක් වු අතර මුද්‍රණ දෙපාර්තුමේන්තුවේ පොත් අනුව එම ශේෂය රු.37,695,022 ක් වූයෙන් රු.30,747,635 ක වෙනසක් විය. | එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ලැබීම් ලෙස සටහන් කරන මුළු අගය ගිණුම් ගත නොකරයි. CIGAS මඟින් ගිණුම්ගත කරනුයේ අවසර දෙනු ලැබු අගයක් පමණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 ආදායම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 වර්ෂය සහ ඊට පෙර වර්ෂවලට අදාළ හිඟ ආදායම රු.166,058,339 ක් වූ අතර එයින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ දී අය කරගෙන නොතිබුණි.එසේම 2010 සිට 2018 වර්ෂය දක්වා මුළු හිඟ ආදායම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදි සියයට 6 ක් පමණක් අයකර ගෙන තිබුණි. | මෙම හිඟ ආදායම් අයකර ගැනීමට අදාල ආයතන වලට ලිපි මඟින් දැනුම් දී ඇති අතර ඒ අනුව මුදල් අයකර ගැනීම සිදු කරමින් පවති. | හිඟ මුදල් අයකර ගැනීමට සුදුසු කඩිනම් වැඩපිළිවෙලක් සකස් කල යුතු වීම. |

### 2.2 වියදම් කළමණාකරණය

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි මු.රෙ 50 (ii) හා (iii) පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට වැය විෂයන් 18 ට අදාලව එකතුව රු.53,457,000 ක ප්‍රතිපාදන සියයට 28 සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරි වී තිබුණි. | 2020 වර්ෂයේ පැවති කොවිඩ්-19 තත්වය හමුවේ අනපේක්ෂිත වියදම් සිදු කිරීමට හැකියාවක් නොමැති වීම හේතුවෙන් මෙලෙස ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**2.3** බැරකම් හා බැදීම් වලට එළඹීම

---

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සැපයුම්කරුවන් සඳහා 2021 වර්ෂයේදී ගෙවන ලද රු.5,516,869 ක් බැරකම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | විවිධ හේතු නිසා බැරකම් ලේඛනයේ සටහන් වූ ගෙවීම් 2021 වර්ෂයේ දී ගෙවීමට සිදු විය. | බැරකම් හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු වීම. |

**2.4** රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය

---

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය නිලධාරින් 03 දෙනෙකු සහ සේවය අත්හැර ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.701,065ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය මුදල් අයකර ගැනිමට නැවතත් කටයුතු සිදුකරමින් පවති. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මෙම මුදල් අය කර ගැනිමට කටයුතු කල යුතුය. |

**2.5** තැන්පතු

---

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 2ක් ඉක්ම වූ එකතු වටිනාකම රු.18,379,027 ක් වූ තැන්පත් 30 ක් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි | වාණිජ මුද්‍රණ සඳහා ලැබෙන ආදායම් තාවකාලිකව මෙම තැන්පත් ගිණුමේ රදවා ඇත.මෙතෙක් එම මුද්‍රණ කාර්යයන් අවසන් වී නොමැත.මුද්‍රණ කාර්යයන් අවසන් වූ විට තැන්පත් ගිණුමෙන් ඉවත් කරමි. | මුදල් රෙගුලාසි අනුව අදාල තැන්පතු ආදායමට ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) එකතු කළ අගය මත බදු ප්‍රතිශතය වෙනස් කිරීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකරන ලද රු.32,570 ක් වර්ෂයට වැඩි කාලයක් තැන්පත් ගිණුමක රදවා ගෙන තිබුණි. | මෙම මුදල් නිරවුල් කිරීමට තැන්පත් කරන ලද ආයතන දැනුවත් කර ඇත.යම් මුදල් ප්‍රමාණයක් නිරවුල් කර ඇති අතර ඉතිරි ශේෂය කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 2.6 ගණන් දීමේ නිලධාරින් විසින් සිදුකළ යුතු සහතික වීම්

-------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධි විධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හා ගණන් දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුව තිබුණත් එවැනි සමාලෝචනයන් සිදුකල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට පත් කර ඇති ප්‍රධාන අභ්‍යන්තර විගණක ලවා දෙපාර්තුමේන්තුවේ අංශ ස්වාධින පරීක්ෂාවකට ලක් කර හදුනා ගන්නා දූර්වලතා නිවැරදි කිරීම, කාර්තු පදනමින් පැවැත්වෙන විගණන හා කළමණාකරණ කමිටුවේද අභ්‍යන්තර පාලන ක්‍රමයන් හි සාර්ථකත්වය ඇගයීමට ලක් කිරීම හා මූල්‍ය හා කාර්යසාධනය ඇගයීමට සකස් කර ඇති පාර්ලිමේන්තුවේ පරිගණක පද්ධතිය වෙත දෙපාර්තමේන්තුවේ තොරතුරු ලබා දීම. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමණාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 5 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා එකතු කල අගය මත බදු සහිතව එකතුව රු.413,233,363 ක ප්‍රතිෂ්ඨාවකට ඡන්ද පත්‍රිකා පොත්, ද්විත්ව ඡන්ද පත්‍රිකා පොත්, ආකෘති පත්‍ර ආදිය මැතිවරණ කොමිසම වෙනුවෙන් මුද්‍රණය කර තිබුණි. මෙහි මුද්‍රණ කටයුතුවලට අදාල සියලු ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.බිලියන 3.24 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය ලබා දී තිබිය දී කිසිදු පිළිගත හැකි හේතුවක් නොදක්වා මුළු ද්‍රව්‍ය සහ ශ්‍රම පිරිවැය වූ රු.318,852,904 න් සියයට 20 ක්ද මුළු ද්‍රව්‍ය පිරිවැයෙන් සියයට 9 ක් වශයෙන් එකතුව වූ රු. 75,721,385 ක් ඉන්වොයිසියට එකතු කර මැතිවරණ කොමිෂමෙන් මුදල් ලබාගෙන තිබුණි. මුද්‍රණ ඉන්වොයිසියේ වටිනාකම වැඩිකිරීම නිසා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින් 24 කට සමාලෝචිත වර්ෂයේ දී වාණිජ මුද්‍රණ දීමනාව ලෙස රු.2,068,861 ක් වැඩිපුර ගෙවා තිබුණි | එදා මෙදා තුරු පිරිවැයකරණයේ දී මෙලෙස මුළු ද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැයෙන් සියයට 20 ක මූල්‍යමය අගයන් ඉන්වොයිසයට එකතු කර ඇත. ද්‍රව්‍ය හැසිරවීමේ අගය(MATERIAL HANDLING CHARGES) ලෙස මුළු ද්‍රව්‍ය පිරිවැයෙන් සියයට 10ක් එකතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ සියලුම ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දෙන බැවින් ඉන්වොයිස් වටිනාකම වැඩිකර දීමනා ලබා නොගත යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් වෙනුවෙන් ඇතැම් වැඩ කොටස් වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමවේදයක් සඳහා 1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබාදී තිබුණි. එසේම 2009 සැප්තැම්බර් 11 දින රැස් වූ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මෙම සේවක දිරි දීමනා ගෙවීම් සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙසට දක්වා තිබු නමුත් 2021 අගෝස්තු වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන දීමනා සම්බන්ධ වාර්තාව සකස් කිරීමේ ක්‍රියාවලිය අවසන් අදියර හි ඇති අතර ඉදිරි සති දෙකක් ඇතුලත එය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි. | 2009 වර්ෂයේ දි රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුවීම හා සුදුසු දීමනා ක්‍රමයක් කඩිනමින් හඳුන්වාදිය යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය උල්ලංඝනය කර කැලි පදනම මත දීමනා ගෙවන කාලය තුළ දෛනිකව පැය 2ක් දක්වා අතිකාල දීමනා සහ නිවාඩු දීමනා ලෙස රු.150,804,766 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | කර්මාන්තශාලාමය පරිසරය තුළ නිලධාරින් සේවයට වාර්තා කිරීමේ දුර්වලතාවය නිසා මෙලෙස අතිකාල හා කැලි ගණනට ගෙවිමේ දීමනා ගෙවනු ලැබේ. | අදාළ කැබිනට් මණ්ඩල තීරණයක් මත කටයුතු කළ යුතු වීම |
| (ඈ) 2018 ජූලි 02 දිනැති රාජ්‍ය පරිපාලන කළමණාකරණ සහ නිතිය හා සාමය පිළිබද අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජෙනරාල් ගේ අංක EST/7/ALLOW/03/0120 දරණ ලිපිය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා අවසන් වරට දීමනා අනුමත කරන ලද 2017 ඔක්තෝබර් 04 දිනැති ලිපියේ කොන්දේසි වලට යටත්ව 2018 වර්ෂ දක්වා පමණක් ගෙවීමට අනුමත කර තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේ දී කිසිදු අනුමැතියකින් තොරව රු.436,781,954 ක් ගෙවා නොතිබුණි. | 2019 හා 2020 වර්ෂ සඳහා දීමනා ගෙවීමට අවශ්‍ය අනුමැතීන් ඉල්ලා 2019 ජුනි 10 හා 2020 දෙසැම්බර් 31 දිනයන් හි ආයතන අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ලිපි යොමු කර ඇත.අනුමැතිය ලැබෙන තෙක් දීමනා ගෙවා ඇත. | වියදම් දැරිමට පෙර අදාළ අනුමැතීන් ලබා ගත යුතුවීම. |
| (ඉ) රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම් ගේ 2019 මාර්තු 28 දිනැති අංක EST/ALLOW/03/0720 දරණ ලිපිය අනුව ආධුනික නිලධාරින්ට පුහුණු කාලය තුළ දෛනික දීමනාව ලෙස රු.700 ක් වුවද දෛනික දීමනාවට අමතරව ආධුනිකයන්ට දෙපාර්තමේන්තුවේ නිත්‍ය සේවකයන්ට හිමි අතිකාල හා කැලි පදනම මත දීමනා ලෙස රු.7,162,261 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත මෙලෙස මුදල් ගෙවා ඇත. | චක්‍රලේඛ විධි විධාන වලට අනුකූලව ගෙවීම් කල යුතුවීම. |

**4.** **මානව සම්පත් කළමණාකරණය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිත්‍ය පදනමට සහ වැඩ බැලීමේ පදනමට සහකාර රජයේ මුද්‍රණාලාධිපතිවරුන් පත් කර ඇති අංශ 10 ක් සඳහා විශේෂ හේතුන් කිසිවක් නොදක්වා වැඩ මුලිකවරුන්, වැඩ බලන හා වැඩ ආවරණය කරන පදනමින් එම අංශවලට සහකාර රජයේ මුද්‍රණාලාධිපතිවරුන් ලෙස සමාලෝචිත වර්ෂයේ දී පත් කර තිබුණි. | මෙම පත්වීම් ඉදිරියේ දී අවලංගු කිරීමට කටයුතු කරමි. | මෙලෙස අවිධිමත් පත්වීම් ලබා දිය යුතු නොවීම. |